## මොරටුව විශ්වවිද්‍යාලය – ශ්‍රී ලංකාව

## පුරප්පාඩු

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01 ඖෂධවේදී (පහල ශ්‍රේණිය)

.

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | : | ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිලිගත් ඖෂධවේදී වශයෙන් සුදුසුකම්ලත් සහතිකයක් ලබා තිබීම. |
| වයස | : | අවුරුදු 45ට නොවැඩි විය යුතුයි |
| **වැටුප් ක්‍රමය | : | රු.31,625-7x300;10x355-37,275/-(මාසික) U-MT1(III A) |
| බඳවා ගන්නා ක්‍රමය | : | සම්මුඛ පරික්ෂණයක් මගිනි. |

### 02 මහජන සෞඛ්‍ය පරික්ෂක (111 ශ්‍රේණිය)

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | : | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන්ගේ විභාගය සමත් වී තිබිම. |
| වයස | : | අවුරුදු 45ට නොවැඩි විය යුතුයි |
| **වැටුප් ක්‍රමය | : | රු.31,625-7x300;10x355-37,275/-(මාසික) U-MT1(III A) |
| බඳවා ගන්නා ක්‍රමය | : | සම්මුඛ පරික්ෂණයක් මගිනි. |

**මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2022.02.11 වන දින හෝ ඊට පෙර ලැබෙනසේ මෙම විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරි/ආයතන (අනධ්‍යයන) වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තවද මේ සඳහා අදළ ආදර්ශ අයදුම්පත්‍රය මෙම විශ්වවිද්‍යාලයේ ආයතන (අනධ්‍යයන) අංශයේ, සහකාර ලේඛකාධිකාරි නමට ලිපිනය ලියූ රු.45.00 ක මුද්දර ඇලවූ 25.5 සෙ.මි.x10 සෙ.මි. ප්‍රමාණයේ ලිපි කවරයක් එවීමෙන් හෝ පැමිණ හෝ මොරටුව විශ්වවිද්‍යාලයේ www.uom.lk (හෝ www.mrt.ac.lk මේ සඳහා පමණි) වෙබ් අඩවිය මගින් ලබාගත හැකිය.

උසස් අධ්‍යාපන ආයතනයන්හී, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවීමට කටයුතු කළයුතු වේ.

**ප්‍රමාද වී ලැබෙන, අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ අයදුම්පත් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා වුවද එම අයදුම්පත නැවත සැළකිල්ලට භාජනය කරනු නොලැබේ.**

ලේඛකාධිකාරි,
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.

2022.01.24